// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2291/05 - 2022 අගෝස්තු මස 01 වැනි සඳුදා - 2022.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - T23/P/174/2004

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2006.05.17 දිනැති හා අංක 1445/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2006.04.27 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් නිට්ටඹුව, රන්පොකුණගම, අංක ඒ/15/බී,සී-2/71 හි පදිංචි බී. එස්. එම්. එස්. ජේ. දිසානායක මහතා සහ කැළණිය, දළුගම හි පිහිටි කැළණිය විශ්වවිද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.01 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්

2022 ජුනි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

A/3165

බී. එස්. එම්. එස්. ජේ. දිසානායක,
A/15/B-C-2/71,
රන්පොකුණගම - නිට්ටඹුව.

සහ

කැළණිය විශ්වවිද්‍යාලය,
දළුගම,
කැලණිය.

ප්‍රදානය

කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව උක්ත දෙපාර්ශවය අතර වූ ආරවුල නිරවුල් කිරීම සඳහා 2006.04.27 දිනැති ලිපියෙන් මා බේරුම්කරුවෙකු ලෙස පත්කොට මා වෙත යොමුකර ඇත.

එම බේරුම්කරණය විභාගය සඳහා 2006.08.02 කැඳවූ අවස්ථාවේ මෙම ආරවුල නිරාකරණය වී ඇති බව දෙපාර්ශවය විසින් දන්වන ලදී. එසේ හෙයින් නිරාකරණය කිරීමට ආරවුලක් නොමැති නිසා මෙම බේරුම්කරයේ කටයුතු මෙයින් අවසන් කරමි.

**අතුල ශ්‍රී නම්මුනි,**
බේරුම්කරු.

2022 ජුනි මස 01 වැනි දින,

EOG 08-0005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.